## P 25 සාරභූමි (Good Earth) නවකථාවෙහි නිරූපිත ස්ත්‍රී ක්ෂතිය (Trauma): චීන ජන සමාජයෙහි විස්තෘත පා වෙළීම (Foot Binding), බිළිඳි ඝාතනය (Female Infanticide) සහ ස්ත්‍රී වහල්භාවය (Female Slavery) පිළිබඳ විමර්ශනයක්

රාජපක්ෂ ඩී.

සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

වර්තමාන චීනය යනු සංවර්ධනයේ ප්‍රවේගය ඔස්සේ ලෝක අවධානය දිනා ගත් රටකි. අද්‍යතන චීන කාන්තාව පුරුෂයා හා සම අයිතිවාසිකම් භුක්ති විඳිමින් කාර්ය සංසිද්ධීන්හි නිරත වුවත්, ක්‍රි.ව. 1900 ට පූර්ව යුගයෙහි විසූ ස්ත්‍රිය මානව අයිතිවාසිකම් නො ලද කෙනෙකු ලෙස ඉතිහාසගත වී තිබේ. ඉපැරණි චීන සංස්කෘතියෙහි නිර්මිත 'පවුල' තුළ ස්ත්‍රිය වෙනුවෙන් ගොඩනැඟුණු පිළිගත හැකි භූමිකාවක් නො වුණු අතර වහල් සේවිකාවන්, අනියම් බිරින්දෑවරුන් සහ වෛශ්‍යාවන් ලෙස කල් ගෙවීමට ඇයට සිදු විය. කිසියම් ස්ත්‍රියක් උත්පත්තියෙන් ප්‍රියමනාප දේහයකට හිමිකම් නොලැබීම ඇගේ වහල්භාවයට හේතු වූ අතර, යමෙකු ශාරීරික රූප සෞන්දර්යයෙන් ශෝභමාන වීම වහල්භාවයෙන් මුක්ත වීමට ද හේතු විය. එහෙත් නූතනත්වයේ සංඥා මඟින් පැරණි චීනය අනුක්‍රමයෙන් පරිවර්තනය වන්නට වූ අතර, 19 වන සියවසේ බටහිර මිෂනාරිවරුන්ගේ ආගමනය සහ ප්‍රාචීන ප්‍රතිසංස්කරණවාදී මතවාද, නවීනත්වයේ හැරවුම් ලක්ෂ්‍යය උදා කළේ ය. 1949 චීනයේ සිදු වූ කොමියුනිස්ට් විප්ලවය එහි ප්‍රතිඵලයකි. පූර්ව විප්ලවීය යුගයේ නවකථාකරණයේ නියැලුණු ඇමරිකානු ලේඛිකාවක වූ පර්ල් එස්. බක් (1892-1973), චීන කාන්තාව විෂයෙහි සිදු වූ මේ අසාධාරණ පෙළීම නිරීක්ෂණය කොට, තමාගේ ස්ත්‍රීවාදී පර්යාවලෝකනය සාරභූමි(Good Earth - 1931) නවකථාවේ ප්‍රධාන කාන්තා චරිත නිරූපණයේ ව්‍යංග්‍යාර්ථ ගත කළා ය. ඓතිහාසික ප්‍රබන්ධයක් (Historical Fiction) ලෙස සැලකෙන මේ නවකථාවට 1938 දී නොබෙල් ත්‍යාගය හිමි වුණි. සාම්ප්‍රදායික චීන ගැමි ගොවියෙකු සහ ඔහු විසින් සිය බිරිඳ වශයෙන් මිලට ගනු ලැබූ වහලියකගේ ජීවන වෘත්තාන්තය මෙයට වස්තුවිෂය වී තිබේ. ග්‍රාමීය ගොවියාගේ විශ්වීයකරණය නිරූපණය කිරීම මෙහි මුඛ්‍ය අරමුණ යි. එහෙත් චීන ජන සමාජයේ ජීවත් වූ පීඩිත ස්ත්‍රියගේ ක්ෂතිය (Trauma) නිරූපණය කොට දැක්වීම ද මෙහි තවත් අරමුණක් යැ යි හැඟෙන්නේ සමස්ත නවකථාව පුරා නිහඬ ව දෝංකාර නංවන ස්ත්‍රී චිත්ත සංක්ෂෝභය, පා බැඳීමේ චාරිත්‍රය, බිළිඳි ඝාතනය සහ දියණියන් වහලියන් සේ විකිණීම යන ක්‍රියා හා සම්පාත වෙමින් කථාව එක දිගට ගලා යන නිසා ය. පා වෙළන ලද ගැහැණිය බාල්දි දහසක් පිරෙන්නට තරමේ කඳුළු සලන විට, පා නො බැඳි ගැහැණිය බාල්දි පන්දහසක් පිරෙන තරමට කඳුළු සලන්නේ ය. මේ සමාජ සත්‍යය සාම්ප්‍රදායික චීන ගැහැණියගේ ක්ෂති තත්ව උත්පාදනය කොට ඇති ආකාරය පිරික්සීම මේ අධ්‍යයන පත්‍රිකාවේ අරමුණ වෙයි.

**ප්‍රමුඛපද**: සාර භූමි, පර්ල් එස්. බක්,පා වෙළීම, බිළිඳි ඝාතනය, වහල් වෙළඳාම